# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,605 — 1958 නොවැම්බර් 29 වැනි සෙනසුරාද — 29.11.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදි)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1958 අංක 521**

අ.ආ.කා. අංකය. C. 218/56 (II).

වාණිජ හා වෙළඳ ඇමති තැන්පත් ගරු ආර්. ජී. සේනානායක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා දිවයිනට පෙරලා පැමිණෙන තුරු, 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා සවාධීනතා) රාජ සභා නියෝගවල 49 (3) වැනි වගන්තිය යටතේ, වාණිජ හා වෙළඳ ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම් ලක්ෂ්මන් රාජපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, 1958 වේ නොවැම්බර මස 28 වැනි දින සිට, වාණිජ හා වෙළඳ ඇමති වශයෙන් වැඩ බැලීමට, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත්කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1958 නොවැම්බර මස 28 වැනි දින,
අග්‍රාණ්ඩුකාරතුමා ගේ කායසීාලය, කොළඹ.

---

## ආණ්ඩුවේ නිවේදන

**1941 අංක 27 දරණ කම්කරු පඩි සහා ආඥපනත**

**නිවේදනයයි**

වර්ෂ 1943 අංක 40 දරන ආඥ පනතින් සංශොධිත වර්ෂ 1941 අංක 27 දරන කම්කරු පඩි සහා ආඥ පනතේ 28 වන වගන්තිය යටතේ, පොල් සැදීමේ කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාව විසින් ඇති කරන ලදුව මීට යාව ඇති උප ලෙඛනයෙහි දක්වා ඇත්තාවූ තීරණයන්, ගරු කම්කරු නිවාස හා සමාජ සේවා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී කම්කරු පඩි සහා ආඥ පනතේ 27 (3) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ තීරණයෝ වර්ෂ 1958 දෙසැම්බර් මස 1 වන දින වලංගු බවට පැමිණෙති.

වර්ෂ 1958 නොවැම්බර් මස 26 වන දින,
කොළඹ දීය.

ආර්. ඇම්. ජී. මොනිපෙනි,
ස්ථිර ලේකම්වරයා,
කම්කරු, නිවාස හා සමාජසේවා අමාත්‍යාංශය.

### උපලෙඛනය

පොල් සැදීමේ කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1949 අප්‍රේල් මස 30 වන දින අංක 9,971 දරන විශෙෂ ගැසට් පත්‍ර නිවේදනයේ උප ලෙඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද වර්ෂ 1950 පෙබරවාරි මස 17 වන දින අංක 10,073 දරන ගැසට් පත්‍රය, 1950 ජූලි මස 28 වන දින අංක 10,131 දරන විශෙෂ ගැසට් පත්‍රය, 1951 ජනවාරි මස 26 වන දින අංක 10,205 දරන ගැසට් පත්‍රය, 1951 මාර්තු මස 30 වන දින අංක 10,229 දරන විශෙෂ ගැසට් පත්‍රය, 1951 අප්‍රියෙල් මස 27 වන දින අංක 10,240 දරන ගැසට් පත්‍රය, වර්ෂ 1953 ජූනි මස 29 වන දින අංක 10,542 දරන විශෙෂ ගැසට් පත්‍රය, 1957 නොවැම්බර් මස 29 වන දින අංක 11,208 දරන ගැසට් පත්‍රය සහ 1958 ඔක්තෝබර් මස 31 වන දින අංක 11,573 දරන ගැසට් පත්‍රය යන ඒවායෙහි පළ වූ නිවේදනයන්හි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කරන ලද්ද වූ තීරණ, එකී උප ලෙඛනයේ II වන කොටස අස්කොට ඒ වෙනුවට පහත දක්වෙන කොටස යොදනු ලැබීමෙන් තවදුරටත් වෙනස්වේ :—

3623—ජේ. ඇන්. ආර් 27084—4,674 (11/58)

" II වන කොටස

ආඥ පනතේ 6 වන වගන්තිය යටතේ වූ නිවේදනයෙහි විස්තර කර ඇති පොල් සැදීමේ කර්මාන්තයේ ඇතැම් කාර්‍ය්‍යයන්ට අදල කෑලි මිම්මේ වැඩ සම්බන්ධයෙන් දනට වලංගුව ඇති අඩුම වේතන ප්‍රමාණයෝ—

| කාර්‍ය්‍යය | | | | ප්‍රමාණය | රු. ශ. |
|---|---|---|---|---|---|
| (1) කපාපු පොල් සැදීමේ දී— | | | | | |
| පොල් ලෙලි ගැසීම | ... | ... | ... | ගෙඩි 1,000 ට | 2 19යි |
| කටු ගැලවීම | ... | ... | ... | ගෙඩි 1,000 ට | 1 13 යි |
| සැහැපු පිට කොටස් ඉවත් කිරීම | | ... | ... | ගෙඩි 1,000 ට | 1 13 යි |
| පොල් මස සේදීම හා කැබලි කිරීම | | ... | ... | රාත්. 1,000 ට | 0 88 යි |
| වේලීම | ... | ... | ... | රාත්. 1,000 ට | 1 31 යි |
| පෙනේරයෙන් හැලීම හා වර්ග කිරීම | | ... | ... | රාත්. 1,000 ට | 1 06 යි |
| ඇහිරීම හා තහඩුවලින් පෙට්ටිවල අකුරු දැමීම රාත්තල් 120 සිට 130 දක්වා වූ පෙට්ටියකට | | | ... | | 0 10 යි |

(2) ගෘහ කර්මාන්තයක් වශයෙන් නොව අන් ලෙසකින් කරනු ලබන කොහු හා කොහු ද්‍රව්‍ය සැදීමේ දී—

| | | | | |
|---|---|---|---|---|
| ලෙලි තැලීම—හො. 1ට (ඇට කෙඳිවල තෙත බර) | ... | ... | ... | 0 94 යි |
| ලෙලි පොඩි කිරීම හා ශුද්ධ කිරීම—හො. 1ට (ඇට කෙඳිවල තෙත බර) | | ... | ... | 0 94 යි |
| ගුදිරිවලට ගන්නා කෙඳි ශුද්ධකිරීම, වේලීම හා බේල් කිරීම—හො. 1ට | | ... | ... | 0 31 යි |
| ඇට කෙඳි කැරලි කොට බැඳීම—හො. 1 ට | ... | ... | ... | 1 50 යි |
| කුඩා ලනු පැදුරු හා ලොකු ලනු පැදුරු සැදීම—කුඩා ලනු පැදුරු වර්ග අඩි 1 ට | | | ... | 0 44 යි |
| ලොකු ලනු පැදුරු වර්ග යාර 1ට | | | ... | 0 15 යි |
| කෙඳි පිරීම හා බැඳීම—හො 1 ට | ... | ... | ... | 3 25 යි " |

---

## 1941 අංක 27 දරණ කම්කරු පඩි සභා ආඥපනත

### නිවේදනයයි

වර්ෂ 1943 අංක 40 දරණ ආඥ පනතින් සංශොධිත වර්ෂ 1941 අංක 27 දරන කම්කරු පඩි සභා ආඥපනතේ 28 වන වගන්තිය යටතේ ගොඩනැගිලි කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාව විසින් ඇති කරන ලදුව මීට යාව ඇති උප ලෙඛනයෙහි දක්වා ඇත්තා වූ තීරණයන් ගරු කම්කරු, නිවාස හා සමාජ සේවා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී කම්කරු පඩි සභා ආඥ පනතේ 27 (3) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම තීරණයෝ වර්ෂ 1958 දෙසැම්බර් මස පළමු වන දින වලංගු බවට පැමිණෙති.

ආර්. ඇම්. ජී. මොනිපෙනි,
ස්ථිර ලේකම්වරයා,
කම්කරු, නිවාස හා සමාජසේවා අමාත්‍යාංශය.

1958 නොවැම්බර් මස 27 වන දින
කොළඹ දීය.

### උපලෙඛනය

ගොඩනැගිලි කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1950 අගෝස්තු මස 25 වන දින අංක 10,141 දරන ගැසට් පත්‍ර නිවේදනයේ උප ලෙඛනයෙහි සවිස්තරව සඳහන්ව ඇත්තා වූද වර්ෂ 1951 මාර්තු මස 30 වන දින අංක 10,229 සහ වර්ෂ 1953 ජූනි මස 29 වන දින අංක 10,542 දරන විශෙෂ ගැසට් පත්‍ර වලද වර්ෂ 1955 ඔක්තෝබර් මස 21 වන දින අංක 10,850 දරන ගැසට් පත්‍රයේ සහ වර්ෂ 1958 අප්‍රේල් මස 30 වන දින අංක 11,306 දරන විශෙෂ ගැසට් පත්‍රයේද පළවූ නිවේදනයන්හි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කරන ලද්ද වූද තීරණ, එකී උප ලෙඛනයෙහි II වන කොටසෙහි මෙහි පහත දක්වෙන පරිදි තවදුරටත් වෙනස්වේ :—

(1) " කවර මාසයක වුව වැඩ කරන සාමාන්‍ය දවසකට විශෙෂ දීමනාවේ ප්‍රමාණය " යන ශීර්ෂය යටතේ—

(i) එහි (ඒ) උප ශීර්ෂයට අයත් කොටසෙහි—

(අ) " 1·63 " යන ඉල ඉලක්කම් අස්කොට ඒ වෙනුවට " 2·00 " යන ඉලක්කම් යෙදීමෙන් ; සහ

(ආ) " 1·73 " යන ඉලක්කම් අස්කොට ඒ වෙනුවට " 2·10 " යන ඉලක්කම් යෙදීමෙන් ද

(ii) එහි (බී) උප ශීර්ෂයට අයත් කොටසෙහි—

(අ) " 1·60 " යන ඉලක්කම් අස්කොට ඒ වෙනුවට " 1·97 " යන ඉලක්කම් යෙදීමෙන් ; සහ

(ආ) " 1·70 " යන ඉලක්කම් අස්කොට ඒ වෙනුවට " 2·07 " යන ඉලක්කම් යෙදීමෙන් ; සහ

(2) එම කොටසේ 3(සී) තීරයේ සඳහන් විධානය භාවිත කරන අන්දම දක්වන ගණන් චක්‍ර අස්කොට ඒවා වෙනුවට පහත දක්වෙන අභිනව ගණන් චක්‍ර යෙදීමෙන් ද වේ :—

" 1 වන ගණන් චක්‍රය.

**ජීවන වියදම් අංකය ඉහළ නැංගවිට විශෙෂ දීමනාව**

| ජීවන වියදම් අංකය | | | නොපුහුණු කම්කරුවකුට | | නොපුහුණු කම්කරුවකු නොවන වැඩ කරුවකුට |
|---|---|---|---|---|---|
| | | | රු. ශ. | | රු. ශ. |
| 1001·—101·8 | ... | ... | 2 0 | ... | 2 10 |
| 1019·—103·6 | ... | ... | 2 03 | ... | 2 13 |
| 1037·—105·4 | ... | ... | 2 06 | ... | 2 16 |
| 1055·—107·2 | ... | ... | 2 09 | ... | 2 19 |
| 1073·—109·0 | ... | ... | 2 12 | ... | 2 22 |

II වන ගණන් චක්‍රය

**ජීවන වියදම් අංකය පහළ බැස්ස විට විශෙෂ දීමනාව**

| ජීවන වියදම් අංකය | | | නොපුහුණු කම්කරුවකුට | | නොපුහුණු කම්කරුවකු නොවන වැඩ කරුවකුට |
|---|---|---|---|---|---|
| | | | රු. ශ. | | රු. ශ. |
| 100·0—98·3 | ... | ... | 1 97 | ... | 2 07 |
| 98·2—96·5 | ... | ... | 1 94 | ... | 2 04 |
| 96·4—94·7 | ... | ... | 1 91 | ... | 2 01 |
| 94·6—92·9 | ... | ... | 1 88 | ... | 1 98 |
| 92·8—91·1 | ... | ... | 1 85 | ... | 1 95 " |

## 1941 අංක 27 දරණ කම්කරු පඩි සභා ආඥපනත

### නිවේදනයයි

වර්ෂ 1943 අංක 40 දරන ආඥපනතින් සංශොධිත වර්ෂ 1941 අංක 27 දරන කම්කරු පඩි සභා ආඥපනතේ 20, 23, 24 සහ 25 වන වගන්ති යටතේ බේකරි කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාව විසින් ඇති කරන ලදුව මීට යාව ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තා වූ තීරණයන් ගරු කම්කරු, නිවාස හා සමාජ සේවා ඇමති තුමන් විසින් අනුමත කරන ලද බව එකී කම්කරු පඩි සභා ආඥපනතේ 27 (3) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ තීරණයෝ වර්ෂ 1958 දෙසැම්බර් මස පළමු වන දින වලංගු බවට පැමිණෙති.

ආර්. ඇම්. ජී. මනිපෙනි,
ස්ථිර ලේකම්වරයා,
කම්කරු නිවාස හා සමාජ සේවා අමාත්‍යාංශය.

1958 නොවැම්බර් මස 27 වන දින,
කොළඹ දීය.

## උප ලේඛනය

## I වන කොටස

### 20 (2) (බී) වන වගන්තිය යටතේ විධානය

1. විශෙෂ දීමනාව කම්කරු කොමසාරිස්වරයා විසින් ගණන් බලා මාසයකට වරක් ප්‍රසිද්ධ කළ යුතු වේ.

2. එක් එක් මාසයේ විශෙෂ දීමනාව එම දීමනාව ගෙවනු ලබන්නේ යම් මාසයක් සඳහා ද ඒ මාසයට පෙර ඉකුත් වූ මාසයේ ජීවන වියදම් අංකය අනුව ගණන් බැලිය යුතුය.

### වේතන ගෙවිය යුතු කාල සීමාව—(23(1) වන වගන්තිය)

3. වේතන මාසික ක්‍රමයට මාසය අවසාන වී දින 10 ක් ඇතුළත ගෙවිය යුතුය.

### වැඩකරන සාමාන්‍ය දවසක් යන්නෙහි අර්ථ නිරූපනය (24 වන වගන්තිය)

4. සේව්‍යයා හා කම්කරුවන් විසින් ගිවිස ගත යුතු වන්නාවූ සතියේ කවර හෝ දවස් 5 ක් සම්බන්ධයෙන්, වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් පැ ගණන වන්නේ—

(අ) කර්මාන්තයෙහි යෙදී සිටින එහෙත් පහත (ආ) අනුච්ඡෙදයෙහි සඳහන් නොවූ සියලුම කම්කරුවන් සඳහා (කෑම වේලකට පැයක් ඇතුළුව) 9ක් ; සහ

(ආ) පහත සඳහන් කම්කරුවන් සඳහා (කෑමට හෝ විවේකයට පැ හතරක් ඇතුළුව) 12 කි :—

පෝර්මන්වරු, මෝලි අල්ලන්නෝ, මනින්නෝ සහ කිරන්නෝ, කැටි වෙන්කරන්නෝ, ගෙතුම්කරුවෝ, ඔතන යන්ත්‍ර ක්‍රියා කර වන්නෝ, පිටි දමන්නෝ, පිටි හලන්නෝ, මේසකරුවෝ, තැටි තෙල් ගල්වන්නෝ, තැටි වැඩකරුවෝ, පාන් තැටි වැඩකරුවෝ, බනිස් තැටි වැඩකරුවෝ, පෝරණු අත් උදව්කරුවෝ, පෝරණුවට තැටි දමන්නෝ, තැටි අඩුක්කරන්නෝ, පාන් සහ බනිස් අඩුක්කරන්නෝ, අතින් ඔතන්නෝ, අහුරන්නෝ සහ සාමාන්‍ය අත් උදව්කරුවෝ.

5. සේව්‍යයා හා කම්කරුවන් විසින් ගිවිස ගත යුතු වන්නාවූ සතියේ කවර හෝ (4 වන ඡෙදයේ සඳහන් දින 5න් එකක් නොවන) එක් දවසක් සම්බන්ධයෙන් කර්මාන්තයේ සියලුම කම්කරුවන් සඳහා වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් වන පැ ගණන (කෑම වේලකට පැයක් ඇතුළුව) 6 කි.

## II වන කොටස

1. කාල ක්‍රමයේ වැඩවලට ගෙවිය යුතු අඩුම වේතන ප්‍රමාණය 6 වන ඡෙදයේ දැක්වෙන පරිදි වූ මූලික වේතන ප්‍රමාණයකින් හා විශෙෂ දීමනාවකින් යුක්ත වන්නේය.

2. මෙම කොටසෙහි සඳහන් කවර පන්තියකට හෝ අයත් කම්කරුවකු මෙහි පහත 1 වන තීරයෙහි සඳහන් යම්කිසි මාසයක එම මාසය වෙනුවෙන් 2 වන තීරයෙහි නියමිත වැඩ කරන අඩුම දින ගණන තුළ වැඩ කර තිබේ නම් ඒ පන්තිය වෙනුවෙන් මෙම කොටසෙහි නියමිත අඩුම මාසික වේතන ප්‍රමාණයට සමාන මුදලක් ඒ මාසයේ වේතනය වශයෙන් එම කම්කරුවාට ගෙවිය යුතුය :—

එසේද වුව ඉරුදින පහක් ඇති කවර මාසයක් සම්බන්ධයෙන් වුවද ඉහත කී 2 වන තීරයේ නියමිත වැඩ කරන අඩුම දින ගණන එක් දවසකින් අඩුවිය යුත්තේය.

මේ ඡෙදය සඳහා වැඩට අවුත් පෙනී සිටින කවර කම්කරුවකුට හෝ වැඩ දීමට සේව්‍යයාට නො හැකි වන කවර දවසක් වුව එම කම්කරුවා වැඩ කළ දවසක් සේ සැළකිය යුතුය.

| තීරය 1<br>මාසය | තීරය 2<br>වැඩ කරන අඩුම දින ගණන |
|---|---|
| ජනවාරි ... ... ... ... | 27 |
| පෙබරවාරි ... ... ... ... | 24 |
| මාර්තු ... ... ... ... | 27 |
| අප්‍රියෙල් ... ... ... ... | 26 |
| මැයි ... ... ... ... | 27 |
| ජූනි ... ... ... ... | 26 |
| ජූලි ... ... ... ... | 27 |
| අගෝස්තු ... ... ... ... | 27 |
| සැප්තැම්බර් ... ... ... ... | 26 |
| ඔක්තෝබර් ... ... ... ... | 27 |
| නොවැම්බර් ... ... ... ... | 26 |
| දෙසැම්බර් ... ... ... ... | 27 |

3. යම්කිසි කම්කරුවකු සම්පූර්ණ මාසයක්ම රක්ෂාවෙහි යෙදී නැති විට ඔහු රක්ෂාවෙහි යෙදී සිටි කාලය, මාසයේ දවස් ගණනට සමාන වන ප්‍රමාණය අඩුම මාසික වේතනයට සමාන වන්නේ යම් ප්‍රමාණයකට ද ඒ ප්‍රමාණයේ මුදලක් ඔහුට වේතන වශයෙන් ගෙවිය යුතුය.

4. මෙම කොටසෙහි සඳහන් කවර පන්තියකට හෝ අයත් කම්කරුවකු අවසර නොලබා වැඩට නොපැමිණීම නිසා කවර මාසයක හෝ ඒ මාසය සඳහා 2 වන ඡෙදයෙහි නියමිත වැඩ කරන අඩුම දින ගණන තුළ වැඩ කර නැති විට, එම මාසයට අදාල වැඩ කරන අඩුම දින ගණන හා අවසර නොලබා වැඩට නොපැමිණි දින ගණන හා අතර වෙනස එම වැඩ කරන අඩුම දින ගණනට සමාන වන ප්‍රමාණය මෙම කොටසෙහි එම කම්කරුවාගේ පන්තියට නියමිත අඩුම වේතනයට සමාන වන්නේ යම් ප්‍රමාණයකට ද ඒ ප්‍රමාණයේ මුදලක් ඔහුට ඒ මාසයේ වේතන වශයෙන් ගෙවිය යුතුය.

5. නිවාඩු දවස් වල හෝ සම්පූර්ණ පඩි සහිත අවසර නිවාඩු දී තිබෙන දවස් වල හෝ වැඩට නොපැමිණීම අවසර නොලබා වැඩට නොපැමිණීමක් ලෙස නොසැලකිය යුතුය.

| 1 | 2 | 3 | | |
|---|---|---|---|---|
| 6. කම්කරුවාගේ පන්තිය | මාසයකට මූලික වේතන ප්‍රමාණය | විශෙෂ දීමනාවේ ප්‍රමාණය | | |
| | | (අ) ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100·1 නම් විශෙෂ දීමනාව වන්නේ | (ආ) ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100·0 නම් විශෙෂ දීමනාව වන්නේ | (ඇ) ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100·0ට වැඩි වූ විට හෝ 100·0ට අඩු වූ විට එය 100·1ට ඉහළ ගෙන ගිය හෝ 100·0ට පහළ ගෙන ගිය හෝ සෑම අංක 1·8ටේ සම්පූර්ණ ඒකකයකට (ඒකකයේ ඛණ්ඩගණන් ගනු නොලැබේ) පහත දක්වෙන ප්‍රමාණයන් අනුව පිළිවෙලින් මෙහි පහත 1 වන හා 2 වන චක්‍රයන්හි නිදර්ශිත පරිද්දෙන් ගණන් බලා එන මුදලකින්, උචිත පරිද්දෙන් මීට ප්‍රථම 3 (අ) තීරයේ නියමිත විශෙෂ දීමනාවේ ප්‍රමාණය වැඩි කළයුතු හෝ 3 (ආ) තීරයේ නියමිත විශෙෂ දීමනාවේ ප්‍රමාණය අඩුකළ යුතු හෝ වන්නේය |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| **"ඒ" පන්තියේ කම්කරුවෝ :** | | | | |
| පෝර්මන්වරු, කෝකීහු, "සුළු කැවිලි" සාදන්නෝ, කැවිලි සාදන්නෝ සහ කේක් වැඩ දමන්නෝ ... ... | 70 0 | 55 0 | 53 55 | 1 45 |
| **"බී" පන්තියේ කම්කරුවෝ :** | | | | |
| මෝලි අල්ලන්නෝ, මනින්නෝ සහ කිරන්නෝ, කැටි වෙන් කරන්නෝ, ගෙතුම් කුරුවෝ, සූප පාන් වැඩ කරන්නෝ, කැවිලි පිටි සාදන්නෝ, සූප පාන් යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ, බදින්නෝ, බටර් සහ වැඩ දමන සීනි කලවම් කරන්නෝ, සීනි වැඩ දමන්නෝ සහ ඔතන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ | 55 0 ... | 51 25 ... | 50 0 ... | 1 25 |
| **"සී" පන්තියේ කම්කරුවෝ :** | | | | |
| පිටි දමන්නෝ, පිටි හලන්නෝ රෝල් කරන යන්ත්‍රකරුවෝ, සීනි අඹරන්නෝ, මේසකරුවෝ, තැටි තෙල් ගල්වන්නෝ, තැටි වැඩකරුවෝ, පාන් තැටි වැඩකරුවෝ, බනිස් තැටි වැඩ කරුවෝ කේක් තැටි වැඩ කරුවෝ, පාන් පෙති කපන්නෝ, පළතුරු සහ එළවළු සුද්ධ කරන්නෝ, කිරම (ක්‍රීම්) පුරවන්නෝ, පෝරනු අත් උදව්කරුවෝ, පෝරණුවට තැටි දමන්නෝ, තැටි අඩුක් කරන්නෝ, පාන් සහ බනිස් අඩුක්කරන්නෝ, කේක් අඩුක්කරන්නෝ, කපන්නෝ, සසින්නෝ, අතින් ඔතන්නෝ, අහුරන්නෝ, සාමාන්‍ය අත් උදව්කරුවෝ සහ ගෙන ගොස් බාර දෙන්නෝ ... | 39 0 ... | 39 91 ... | 39 10 ... | 0 81 |

## ඉහත තුන්වන තීරයේ දැක්වූ විධානය භාවිත කරන අන්දම දක්වන I වන ගණන් චක්‍ර

### ජීවන වියදම් අංකය ඉහළ නැංගවිට විශෙෂ දීමනාව

| ජීවන වියදම් අංක | | | "ඒ" පන්තිය | | "බී" පන්තිය | | "සී" පන්තිය |
|---|---|---|---|---|---|---|---|
| | | | රු. ශ. | | රු. ශ. | | රු. ශ. |
| 100.1 සිට 101.8 දක්වා | ... | ... | 55 0 | ... | 51 25 | ... | 39 91 |
| 101·9 සිට 103·6 දක්වා | ... | ... | 56 45 | ... | 52 50 | ... | 40 72 |
| 103.7 සිට 105·4 දක්වා | ... | ... | 57 90 | ... | 53 75 | ... | 41 53 |
| 105·5 සිට 107·2 දක්වා | ... | ... | 59 35 | ... | 55 0 | ... | 42 34 |
| 107·3 සිට 109·0 දක්වා | ... | ... | 60 80 | ... | 56 25 | ... | 43. 15 |

## II වන ගණන් වක්‍ර

### ජීවන වියදම් අංකය පහළ බැස්සවිට විශෙෂ දීමනාව

| ජීවන වියදම් අංක | "ඒ" පන්තිය රු. ශ. | "බී" පන්තිය රු. ශ. | "සී" පන්තිය රු. ශ. |
|---|---|---|---|
| 100·0 සිට 98·3 දක්වා | 53 55 | 50 0 | 39 10 |
| 98·2 සිට 96·5 දක්වා | 52 10 | 48 75 | 38 29 |
| 96·4 සිට 94·7 දක්වා | 50 65 | 47 50 | 37 48 |
| 94·6 සිට 92·9 දක්වා | 49 20 | 46 25 | 36 67 |
| 92·8 සිට 91·1 දක්වා | 47 75 | 45 0 | 35 86 |

## III වන කොටස

### අතිකාල වැටුප් ප්‍රමාණය

1. 1 වන කොටසේ 4 වන ඡෙදයෙහි සඳහන් සතියේ දවස් පහෙන් කවර දවසක වුවත් වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් පැ ගණනට වැඩිපුර වැඩ කරන එක් එක් පැයකට ගෙවිය යුතු අඩුම අතිකාල වැටුප් ප්‍රමාණය වූ කලී (අඩුම මාසික ප්‍රමාණය 200 න් බෙද සොයාගත යුතු) පැයකට ගෙවන අඩුම ප්‍රමාණය එම ප්‍රමාණයෙන් සියයට 50 කින් වැඩි කළ විට ලැබෙන ප්‍රමාණය වන්නේය.

2. 1 වන කොටසේ 5 වන ඡෙදයෙහි සඳහන් දවසෙහි වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් පැ ගණනට වැඩිපුර වැඩ කරන එක් එක් පැයකට ගෙවිය යුතු අඩුම අතිකාල වැටුප් ප්‍රමාණය වූ කලී (අඩුම මාසික ප්‍රමාණය 200 න් බෙද සොයා ගත යුතු) පැයකට ගෙවන අඩුම ප්‍රමාණය එම ප්‍රමාණයෙන් සියයට 75 කින් වැඩි කළ විට ලැබෙන ප්‍රමාණය වන්නේය.

## IV වන කොටස

### සතිපතා නිවාඩු දිනය (24 වන වගන්තිය)

1. සෑම සේවායකු තමා යටතේ සේවය කරන සෑම කම්කරුවකුට තමාත් එම කම්කරුවාත් අතර ගිවිස ගත යුතු වන්නා වූ සතියේ එක් දවසක් සතිපතා නිවාඩු දිනය වශයෙන් දිය යුතුය.

එසේ ද වුව පහත සඳහන් නියමයනට යටත්ව කවර කම්කරුවකු වුවද එබඳු සතිපතා නිවාඩු දිනයක වැඩෙහි යොදවා ගැනීමට සේවායකුට පුළුවන :—

(අ) එම සතිපතා නිවාඩු දවසට පසුව එන සදින ඇතුළත දවසක් ඔහුට නිවාඩු දිනයක් වශයෙන් දිය යුතුය ; මෙය එම කම්කරුවාට කම්කරු පඩි සභාවේ තීරණවල විධිවිධාන යටතේ හෝ කම්කරු පඩි සභා ආඥපනතේ හෝ වෙනයම් කිසි නීතියක විධිවිධාන යටතේ හෝ ඔහුගේ සේවා ගිවිසුමේ කොන්දේසි යටතේ හෝ හිමි යම් කිසි නිවාඩුවක්, අවසර නිවාඩුවක් හෝ වැඩට නොපැමිණෙන දිනයක් හෝ වෙතොත් ඊට අමතරව විය යුතුය;

(ආ) එම සතිපතා නිවාඩු දිනයෙහි කරන ලද වැඩ වෙනුවෙන් එම කම්කරුවාට මාසික ක්‍රමයට ගෙවන වේතනයට අමතරව අඩුම මාසික ප්‍රමාණයෙන් 1/25 කට නොඅඩු ගෙවීමක් කළ යුතුය;

(ඇ) එබඳු සතිපතා නිවාඩු දිනයක 1 වන කොටසේ 4 වන ඡේදය යටතේ වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් පැ ගණනට වැඩිපුර වැඩ කරන එක් එක් පැයකට ගෙවිය යුතු අඩුම අතිකාල වැටුප් ප්‍රමාණය වූ කලී අඩුම මාසික ප්‍රමාණය 200 න් බෙද සොයා ගත යුතු පැයකට ගෙවන අඩුම ප්‍රමාණය මෙන් දෙක හමාරකට සමාන මුදලක් වන්නේය ; සහ

(ඇ) යම් මාසයකදී සතිපතා නිවාඩු දිනයෙහි කළ වැඩ වෙනුවෙන් කම්කරුවකුට කළ යුතු වන ගෙවීම එම මාසය සඳහා ගෙවන වේතනය සමග ගෙවිය යුතුය.

## V වන කොටස

### වාර්ෂික නිවාඩු (25 වන වගන්තිය)

1. යම්කිසි වර්ෂයක යම් කම්කරුවකු එකම සේවායා යටතේ දින 218 කට වැඩියෙන් වැඩ කර තිබේ නම් දින 218 ට වැඩිපුර වැඩ කළ දින ගණනේ සෑම දින පහේ ඒකකයට එක් නිවාඩු දිනය බැගින් ගණන් බලා එන නිවාඩු දිනය හෝ දින ගණන ඊළඟ වර්ෂයේදී ඔහුට දිය යුතුය.

එසේද වුව දින 288 කට වැඩිපුර වැඩ කළ යම් කාලයක් වේ නම් ඒ වෙනුවෙන් එබඳු කිසි නිවාඩුවක් දීමට සේවායා බැඳී නැත්තේය.

2. කම්කරුවකුට නිවාඩු දින 6 කට වඩා හිමි කම් තිබේ නම් ඉන් දින 6ක් එක දිගටම ඔහුට දිය යුතුවාක් මෙන් ඔහු විසින් ඒවා එසේ ගත යුතුද වන්නේය.

3. කම්කරුවකුගේ නිවාඩු දිනය හෝ දින ගණන 2 වන ඡේදයේ විධිවිධාන වලට යටත්ව ඔහුත් ඔහුගේ ස්වාමියාත් අතර ගිවිස ගන්නා දිනයක හෝ දිනවල දිය යුතු වන්නේය.

4. කම්කරුවෙක් සිය කැමැත්තෙන්ම රක්ෂාවෙන් අස්වීමට අදහස් කරයි නම් හෝ රක්ෂාවෙන් නතර කරනු හෝ පහ කරනු ලැබීමට සිටී නම් හෝ එසේ අස්වීමට, නතර කරනු ලැබීමට හෝ පහ කරනු ලැබීමට පෙරටුව ඇති කාල පරිච්ඡේදය තුළ පහත සඳහන් නිවාඩු ලබා ගැනීමට එම කම්කරුවාට හිමි කම් ලැබෙන්නේය :—

(අ) ඉකුත් වර්ෂය වෙනුවෙන් හිමිව තිබී ඔහු විසින් එතෙක් නොගන්නා ලද සෑම නිවාඩු දිනයක් ; සහ

(ආ) 1 වන ඡේදයෙහි සඳහන් රක්ෂාවට හා වැඩ පළවලට අදාල විධිවිධාන පවත්නා වර්ෂය තුළ ඒ වූ පරිද්දෙන් පිළිපදනා ලද්දේ නම් ඉහත කී පරිදි රක්ෂාව කෙළවර නොවන්නට ඊළඟ වර්ෂයේදී ඔහුට හිමි වන්නාවූ සෑම නිවාඩු දිනයක් ;

එසේද වුව කවර වර්ෂයකදී වුවත් එබඳු කම්කරුවකු විසින් ගත හැකි නිවාඩු දින ගණන 21 කට වැඩි නොවිය යුතුය.

5. මේ කොටසෙහි සඳහන් එක් එක් නිවාඩු දිනය සඳහා කළ යුතු ගෙවීම විය යුත්තේ අඩුම මාසික වැටුප් ප්‍රමාණය 25න් බෙද සොයා ගත යුතු අඩුම දෛනික වැටුප් ප්‍රමාණයට සමාන මුදලකි.

6. 1 වන ඡේදය සඳහා " කම්කරුවා වැඩ කළ දවස් ගණන " යන්නට පහත සඳහන් දවස්ද ඇතුළති :—

(i) සැළකිල්ලට භාජනවී පවත්නා කිසියම් අවුරුද්දක කිසියම් ඉහත අවස්ථාවක 25 වන වගන්තිය යටතේ සේවායා විසින් කම්කරුවාට දෙන ලද සෑම නිවාඩු දිනයක් ;

(ii) සේවායාගෙන් අනුමතිය ලද කවර හේතුවක් නිසා හෝ වැඩට නො පැමිණි සෑම දවසක් ;

(iii) රක්ෂාවෙහි යෙදී සිටියදී එයින්ම ඇති වූ අනතුරකින් කම්කරුවා ලැබූ තුවාලයක් හේතුකොට ගෙන වැඩට නොපැමිණි සෑම දවසක් ;

(iv) කම්කරු වන්දි පිළිබඳ ආඥ පනතේ (117 වන පරිච්ඡේදය) 3 වන උප ලේඛනයේ විස්තර වන කිසියම් වෘත්තීය රෝගයක් නිසා වැඩට නොපැමිණි සෑම දවසක් ;

(v) කම්කරුවාට වැඩ දීමට සේවායාට නොපුළුවන් වන සෑම දවසක් ;

(vi) දිගටම දින 30 කට වඩා නොපැවැති නීති විරෝදී නොවූ වැඩ නැවැත්වීමක් හෝ වැඩ නොදීමක් නිසා වැඩට නොපැමිණි සෑම දවසක් ; සහ

(vii) කම්කරු පඩි සභා ආඥ පනත හැර වෙන යම් කිසි ග්‍රන්ථාරූඪ නීතියකින් හෝ නීතියක විධිවිධාන යටතේ හෝ කම්කරුවකුට හිමිකම ඇති සෑම නිවාඩු දවසක් හෝ වැඩට නොපැමිණ සිටිය හැකි දවසක් ;

එහෙත් 24 වන වගන්තිය යටතේ සතිපතා නිවාඩු දිනය වශයෙන් නියම කරන ලද දවස ඊට නොඇතුළත් නොවන්නේය.

7. පූර්වෝක්ත තීරණයෝ වර්ෂ 1957 ජනවාරි මස 1 වන දිනට කලින් කවර කලකෙ වූ රක්ෂාව කෙරෙහි වුවද බල නොපවත්වති.

**ආණ්ඩුවේ නිවාඩු දවස්**

8. සෑම සේවායකු තමා යටතේ සේවයෙහි යොදවා ගෙන සිටින්නාවූ සියලුම කම්කරුවන්ට නිවාඩු ආඥා පනත යටතේ සැලකෙන්නාවූ පහත දැක්වෙන ආණ්ඩුවේ නිවාඩු දවස්වල නිවාඩු දිය යුතුය :—

(1) දෙමළ තෛපොන්ගල් දිනය ;

(2) නිදහස් අනුස්මරණ දිනය (පෙබරවාරි 4 ) ;

(3) සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනය ;

(4) මැයි දිනය ;

(5) සිංහළ ක්‍රමය අනුව වෙසක් මාසයේ පුර පසළොස්වක් දිනය ;

(6) රාමසන් අවසානයෙන් පසු දිනය ; සහ

(7) නත්තල් දිනය :

එසේද වුව පහත සඳහන් නියමයකට යටත්ව කවර කම්කරුවකු වුවද එබඳු කවර ආණ්ඩුවේ නිවාඩු දිනයක වුවත් වැඩෙහි යොදවා ගැනීමට සේවායකුට පුළුවන :—

(අ) එම කම්කරුවා එබඳු ආණ්ඩුවේ නිවාඩු දිනයකදී එදිනට අදල වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් පැ ගණනට වැඩියෙන් වැඩෙහි යොදවා නොගත යුතුය ;

(ආ) එම කම්කරුවාට එබඳු ආණ්ඩුවේ නිවාඩු දිනයට පෙර දිනය නිවාඩු දවසක් වශයෙන් දිය යුතුය. නැතහොත්, මාසික ක්‍රමයට ගෙවන වේතනයට අමතරව අඩුම මාසික වැටුප් ප්‍රමාණයෙන් 1/25 කට නොඅඩු ගෙවීමක් කළ යුතුය ; සහ

(ඇ) එම කම්කරුවා එබඳු ආණ්ඩුවේ නිවාඩු දිනයට පෙර දිනයෙහි වැඩෙහි යොදවා ගන්නේ නම් ඒ දිනයෙහිදී එදිනට අදල වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් පැ ගණනට වැඩියෙන් ඔහු වැඩෙහි යොදවා ගත යුතුය.

---

**1950 අංක 25 දරණ ආහාර පාලන පනත**

**අංක 106 දරණ නියෝගය**

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) (i) වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව කෘෂිකර්ම හා ආහාර ඇමති තැන්පත් දොන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, අනුරාධපුර දිස්ත්‍රික්කයෙන්, ආහාර පාලක විසින් හෝ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලක විසින් හෝ උප ආහාර පාලක විසින් හෝ ඔවුන් වෙනුවෙන් නිකුත්කරනු ලැබූ බලපත්‍රයක් නැතිව කිසිම වී වර්ගයක් කුමන ප්‍රමාණයක්වත් ඉවත් කිරීම හෝ රථවාහන වලින් ගෙනයාම මෙම නියෝගයෙන් තහනම් කරමි.

මෙම නියෝගය සඳහා '' දිස්ත්‍රික්කය '' යනුවෙන් හැඟවෙන්නේ ආණ්ඩුවේ ඒජන්ත තැනගේ ආදයම් ප්‍රදේශය යි.

1958 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹදී ය.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

---

# මිල පාලන දැන්වීම්

**ආහාර මිළ නියෝගය ඇන්/ඊ42**

**අතිරේක ආහාර ද්‍රව්‍ය**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් ඒ. සී. බතෝලමියුස් වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4වෙනි වගන්තියෙන් සහ එම පනතේ 3(2) වැනි වගන්තියෙන් මාහට පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 සැප්තැම්බර් 15 වැනි දින අංක 11,525 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පල කරන ලද 1958 සැප්තැම්බර් 10 වැනි දින අංක ඇන්/ඊ 39 දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛණයන්හි 2 වෙනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව, එම උපලේඛණයන්හි 3වෙනි තීරයේ සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිලද, මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛණයන්හි 2වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් ද, උපලේඛණයන්හි 1 වැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළද, මේ දුන් පටන් මේ උපලේඛණයන්හි 3 වෙනි තීරයේ සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම් නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උපලේඛණයන්හි 2 වැනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව 1958 සැප්තැම්බර් 15 වෙනි දින අංක 11,525 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අතිරේක ආහාර සම්බන්ධව 1958 සැප්තැම්බර් 10වැනි දින අංක ඇන්/ඊ 39 දරණ ආහාර මිළ නියෝගයේ 3 සිට 10 දක්වා ඡේදයන්, මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ සැටියට සැලකිය යුතු ලෙසද, මෙම නියෝගයෙන් නියම කරමි.

1958 නොවම්බර් මස 24වෙනි දින පෙරවරු 11.00ට නුවරඑළියේ කච්චේරියේදී අත්සන් තබන ලදී.

ඒ. සී. බතෝලමියුස්,
සහකාර මිළ පාලක (ආහාර) තැන, නුවරඑළිය.

## උපලේඛනය ''ඒ''

### ශුද්ධ බර හොණ්ඩරයක වැඩිම තොග වෙළඳ මිළ

| 1 තීරය<br>ප්‍රදේශය | 2 තීරය<br>විස්තරය | 3 තීරය<br>ශුද්ධ බර හොණ්ඩරය කට තොග වෙළෙන් දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. නුවරඑළියේ නාගරික සභා ප්‍රදේශය | වියලි මිරිස් ... | 90 20 |
| 2. කඳපොල | | |
| 3. නානුඔය ... ... | | |
| 4. රම්බොඩ වවුම ... ... | | |
| 5. සංගිලිපාලම ... ... | | |
| 6. කුඩාඔය ... ... | | |
| 7. පුන්ඩළුඔය ... ... | | |
| 8. තිස්පනේ කොරලේ ... | | |
| 9. පල්ලෙපනේ කෝරලේ ... | | |
| 10. මෝරපේ ... ... | | |
| 11. විලිකුල්වු ... ... | | |
| 12. ඩයගම ... ... | | |
| 13. ආගරපතන ... ... | | |
| 14. මැදපනේ ගමසභා ප්‍රදේශය ... | | |
| 15. රාගල ... ... | වියලි මිරිස් ... | 90 59 |
| 16. උඩපුස්සැල්ලාව ... ... | | |
| 17. නිල්දණ්ඩාහින්න ... | වියලි මිරිස් ... | 91 90 |
| 18. හරස්බැද්ද ... ... | | |
| 19. වතුමුල්ල ... ... | | |
| 20. කුඹල්ගමුව ... ... | | |
| 21. දිඹුල ... ... | වියලි මිරිස් ... | 89 15 |
| 22. වටගොඩ ... ... | | |
| 23. තලවාකැලේ ... ... | | |
| 24. ලිඳුල ... ... | | |
| 25. වලහ ... ... | | |
| 26. කොටගල ... ... | | |

**සැලකිය යුතුයි.**—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මෙ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

## උපලේඛනය ''බී''

### ශුද්ධ බර රාත්තලක වැඩිම සිල්ලර වෙළඳ මිළ

| 1තීරය<br>ප්‍රදේශය | 2 තීරය<br>විස්තරය | 3 තීරය<br>ශුද්ධ බර රාත්තලකට සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. නුවරඑළිය නාගරික සභා ප්‍රදේශය ... | වියලි මිරිස් ... | 0 89 |
| 2. නානුඔය ... ... | | |
| 3. කඳපොල ... ... | | |
| 4. රාගල ... ... | | |
| 5. උඩපුස්සාල්ලාව ... ... | | |
| 6. රම්බොඩ වවුම ... ... | | |
| 7. සංගිලිපාලම ... ... | | |
| 8. කුඩාඔය ... ... | | |
| 9. පුන්ඩළුඔය ... ... | | |
| 10. තිස්පනේ කෝරලේ ... | | |
| 11. පල්ලෙපනේ කෝරලේ ... | | |
| 12. මෝරපේ ... ... | | |
| 13. විලිකුල්වු ... ... | | |
| 14. ඩයගම ... ... | | |
| 15. ආගරපතන ... ... | | |
| 16. මැදපනේ ගමසභා ප්‍රදේශය ... | | |
| 17. දිඹුල ... ... | | |
| 18. වටගොඩ ... ... | | |
| 19. තලවාකැලේ ... ... | | |
| 20. ලිඳුල ... ... | | |
| 21. වලහ ... ... | | |
| 22. කොටගල ... ... | | |
| 23. අඹේවෙල ... ... | වියලි මිරිස් ... | 0 92 |
| 24. නිල්දණ්ඩාහින්න ... | | |
| 25. හරස්බැද්ද ... ... | | |
| 26. වතුමුල්ල ... ... | | |
| 27. කුඹල්ගමුව ... ... | | |
| 28. රූපහ ... ... ... | වියලි මිරිස් ... | 0 93 |

**සැලකිය යුතුයි.**—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ, ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මෙ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.